# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT
# 2022

## සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
### சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சு
## Ministry of Tourism & Lands

### ඉඩම් අංශය
### காணிப் பிரிவு
### Land Section


***"මිහිකත මැදුර"***
ඉඩම් මහ ලේකම් කාර්යාලය
*1200/6, රජමල්වත්ත පාර,*
බත්තරමුල්ල.

"மிஹிகத்த மெதுர,"
காணிச் செயலகம்
1200/6, இராஜமல்வத்தை வீதி,
பத்தரமுல்லை.

"Mihikatha Medura"
Land Secretariat Office
1200/6, Rajamalwatta Rd,
Battaramulla.

# සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

# ඉඩම් අංශය

# කාර්ය සාධන වාර්තාව

# 2022

## පටුන


| | පිටුව |
|---|---|
| 01. ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරංශය | 01 -04 |
| 1.1 හැදින්වීම | |
| 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | |
| 1.3 ප්‍රධාන කාර්යයන් | |
| 1.4 සංවිධාන සටහන | |
| 1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු | |
| 02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 04 -11 |
| 03. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 12 -16 |
| 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | |
| 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | |
| 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | |
| 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් | |
| 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | |
| 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය | |
| 3.7 මු.රෙ. 208 ප්‍රකාරව ලද ප්‍රතිපාදන | |
| 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | |
| 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව | |
| 04. කාර්ය සාධන දර්ශක | 16 |
| 05. තිරසාර සංවර්ධන අරමුණු (SDG ) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 16 -18 |
| 06. මානව සම්පත් පැතිකඩ | 19 - 21 |
| 07. අනුකූලතා වාර්තාව | 22 - 28 |

## 2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

**ආයතනයේ නම - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය - ඉඩම් අංශය**

**වැය ශීර්ෂ අංකය - 122**

## 01. පරිච්ඡේදය - ආයතන පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැඳින්වීම

1927 රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් ඉඩම් හා කෘෂිකර්ම විෂය සම්බන්ධයෙන් පත් කළ කමිටුවේ නිර්දේශ පරිදි 1932 වසරේ දී රජයේ ඉඩම් ප්‍රශස්ත අයුරින් කළමනාකරණය කිරීමේ අරමුණින් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය පිහිටුවා ඇත. වර්ෂ 1800 අගෝස්තු මස 02 දින පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ පැරණිතම දෙපාර්තමේන්තුව වන මිනින්දෝරු දෙපාර්තමේන්තුව ද, 1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥා පනතින් ස්ථාපිත ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව ද, ශ්‍රී ලංකාව තුළ පිහිටි ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු විධිමත් හා කාර්යක්ෂමව සිදුකිරීමේ අරමුණින් 1903 වර්ෂයේ දී පිහිටුවන ලද ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව ද, 1972 අංක 01 දරණ පනත යටතේ පිහිටුවා ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව ද, 1983 වර්ෂයේ දී ඉඩම් හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශය ද වශයෙන් ආරම්භ කර, 2010 ජනවාරි මස සිට දෙපාර්තමේන්තුවක් ලෙස උසස් කළ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවද, ඉඩම් අමාත්‍යාංශය යටතට පත්කර ඇත. මෙයට අමතරව මිනින්දෝරු දෙපාර්තමේන්තුව යටතේ දෙපාර්තමේන්තුවට ආවේනික කටයුතු සඳහා නිලධාරීන් පුහුණු කිරීම හා සංවර්ධනය කිරීමේ අරමුණින් මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය හා 2002 අංක 17 දරණ මැනුම් පනතේ විධිවිධාන අනුව මිනින්දෝරු සේවාවේ වෘත්තීය ප්‍රමිතීන් ක්‍රමවත්ව පවත්වාගෙන යාමේ අරමුණින් පිහිටුවාගෙන ඇති ඉඩම් මැනුම් සභාව ද ඉඩම් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති අතර ඉඩම් අත්පත් කර ගැනීමේ දී ඇතිවන ගැටළු විසඳා ගැනීමේ අරමුණින් 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත මඟින් ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය ද පිහිටුවා ඇත .

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

| තිරසාර සංවර්ධනය උදෙසා ප්‍රශස්තව උපයෝජිත භූමි සම්පතක් |
|---|

**මෙහෙවර**

| සැමට විධිමත් නිරවුල් හිමිකමක් හා ප්‍රශස්ත උපයෝජනයක් අත්කර දෙමින් සියලු පාර්ශවකරුවන් වෙනුවෙන් ප්‍රතිපත්ති සම්පාදනය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය මඟින් භූමි සම්පත කාර්යක්ෂමව කළමනාකරණයෙන් තිරසාර සංවර්ධනයට දායක වීම. |
|---|

**අරමුණු**

- ජාතික ඉඩම් ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- මතු පරපුර වෙනුවෙන් භෞමික පරිසරය සුරැකීම.
- රජයේ ඉඩම්වල ආරක්ෂාව සහතික කිරීම.
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- රජයේ ඉඩම් ප්‍රශස්ත භාවිතය හා හායනයට පත්වීම වැළැක්වීමට ක්‍රියා කිරීම.
- රජයේ ඉඩම් මනාව කළමනාකරණය කිරීම හා සුදුසු ඉඩම්, ඉඩම් අහිමි ජනතාව අතර බෙදාදීම සහ සංවර්ධනය කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති සහ අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා ඉඩම් ලබා දීම.
- රටේ සියළු ඉඩම්වල හිමිකම තහවුරු කර අයිතිය ලියාපදිංචි කිරීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

- ඉඩම් විෂයට අයත් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- රජයේ ඉඩම් පරිපාලනය, කළමනාකරණය හා ඉඩම් පරිහරණ සැලසුම්කරණය.
- ඉඩම් නිරවුල් කිරීම හා ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු.
- රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් අප්‍රමාදව හා නියමානුකූලව ලබාදීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම් පරිපාලනය හා නීත්‍යානුකූලව බෙදා දීම.
- ඉඩම් මැනීම සහ සිතියම්ගත කිරීම, ඉඩම් තොරතුරු සහ අදාළ සේවාවන් ලබාදීම.

## 1.4. ඉඩම් අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සංවිධාන සටහන



## 1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන

- ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
- ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
- ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
- මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය
- ඉඩම් මැනුම් සභාව
- ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය

# 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1. ප්‍රගතිය - ප්‍රතිපත්ති අංශය

### 2.1.1. පනත් සංශෝධනය

| සංශෝධනය කරමින් පවතින පනත් | ප්‍රගතිය |
|---|---|
| 1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥාපනත | නේවාසික කටයුතු සඳහා ඉදිරියේදී ලබා දෙන සියලු බලපත්‍ර සඳහා එම කොන්දේසි රහිත පූර්ණ අයිතිය ඇති දීමනා පත්‍රයන් නිකුත් කිරීම සහ මෙම පනත යටතේ මෙතෙක් නේවාසික කටයුතු සඳහා නිකුත් කර ඇති සියලු දීමනා පත්‍රවල සඳහන් කොන්දේසි මෙම පනත සංශෝධිත දිනයේ සිට බල රහිත කර පූර්ණ අයිතිය ඇති දීමනා පත්‍ර සේ සලකා කටයුතු කිරීම සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අංක 5/6/1/1CM/22/19 හා 2022.11.02 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අංක අමප/22/1768/615/018 හා 2022.11.29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර සංශෝධිත පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරමින් පවතී. |
| 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත | අධිකරණ අමාත්‍යාංශයෙන් නැවත විමසීම. |
| 1950 අංක 09 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත | නීති කෙටුම්පත් සම්පාදක වෙතින් සංශෝධිත පනත් කෙටුම්පත ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මේ වන විට ඉඩම් අමාත්‍යාංශය විසින් නිරීක්ෂණය සකස් කරමින් පවතී. |
| 1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පනත | වාරිමාර්ග රක්ෂිත සීමා සංශෝධනය රජයේ ඉඩම් ආඥා පනත යටතේ නීතියක් ලෙස ගැසට් මඟින් ප්‍රකාශ කිරීම සඳහා උපකාරක නීති කෙටුම්පතක් ප්‍රතිශෝධනය සඳහා අවශ්‍ය වන්නා වූ නියමයන්ට අනුව නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කරන ලෙසට දන්වා ඇති අතර ඒ අනුව යොමු කිරීමට කටයුතු කරමින් පවතී. |
| 2002 අංක 17 දරණ මිනින්දෝරු පනත | මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් සහ මැනුම් සභාවෙන් යෝජනා කැඳවීම. |

## 2.1.2. ඉඩම් අත්පත් අංශය

| 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා ඉඩම් අත්කර ගැනීම පිළිබඳ භෞතික ප්‍රගතිය | | | | | |
|---|---|---|---|---|---|
| අනු අංකය | ක්ෂේත්‍රය අනුව ඉඩම් අත්කර ගැනීම | අත්කර ගැනීම් ආරම්භ කරන ලද ඉඩම් ප්‍රමාණය | අත්කර ගැනීම් ආරම්භ කරන ලද ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්) | භුක්තිය භාරගත් ඉඩම් ප්‍රමාණය (කැබලි සංඛ්‍යාව) | භුක්තිය භාරගත් ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
| 01 | මහාමාර්ග | 47 | 33.53889 | 2897 | 84.0453 |
| 02 | වාරිමාර්ග | 14 | 59.6494 | 2774 | 1889.3467 |
| 03 | පානීය ජලය | 53 | 11.3294 | 42 | 4.5055 |
| 04 | නාගරික සංවර්ධන | 09 | 2.1246 | 106 | 30.67208 |
| 05 | ආරක්ෂක කටයුතු | 07 | 72.3189 | 20 | 36.8027 |
| 06 | ගම් පුළුල් කිරීම | 07 | 26.1358 | 124 | 77.5483 |
| 07 | අනෙකුත් පොදු කටයුතු | 188 | 1344.7524 | 568 | 71.43285 |
| එකතුව | | 325 | 1549.84939 | 6531 | 2194.3534 |

**2.1.3.** **<u>ඉඩම් අංශය</u>**

**2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා ප්‍රගතිය**

| අනු අංකය | ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|---|
| **1.** | **ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යොමු කිරීම** | |
| 1.1 | බදු හා දීමනාපත්‍ර නිර්දේශ ගොණු (රජයේ ඉඩම් ආඥා පනත යටතේ) | **3557** |
| 1.2 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාපිත බැදීම් | **10** |
| **2.** | **අතිගරු ජනාධිපතිතුමාගේ  අත්සන සඳහා යොමු කිරීම (රජයේ ඉඩම් ආඥා පනත යටතේ)** | |
| 2.1 | බදුකර හා දීමනාපත්‍ර (277+979) | **1256** |
| 2.2 | පූජාභූමි දීමනාපත්‍ර | **35** |
| 2.3 | සුනාමි දීමනාපත්‍ර | **473** |
| 2.4 | ව්‍යස්ථාපිත ආයතන සඳහා පැවරීම් අනුමැතිය ලබාගැනීම | **212** |
| **3.** | **ඉඩම් ගැටලු අදාළ ආයතන වෙත යොමු කිරීම** | |
| 3.1 | ජනාධිපති කාර්යාලයෙන් ලැබෙන ඉඩම් ගැටළු අදාළ ආයතන වෙත යොමු කිරීම | **1933** |
| 3.2 | අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ලැබෙන ඉඩම් ගැටළු අදාළ ආයතන වෙත යොමු කිරීම | **112** |
| 3.3 | මහජනයාගෙන් ලැබෙන ඉඩම් ගැටළු අදාළ ආයතන වෙත යොමු කිරීම | **1279** |

## 2.1.4. ව්‍යාපෘති අංශය

**2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා ප්‍රගතිය**

| අනු අංකය | ව්‍යාපෘතිය හා ආයතනයේ නම | | 2022 ඉලක්කය | 2022 ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01. | බිම් සවිය | (i) මිනින්දෝරු දෙපාර්තමේන්තුව - මැනුම් කරන ලද මුළු ඉඩම් කැබලි සංඛ්‍යාව | 69,030 | 117,321 |
| | | (ii) ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව - 14 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා අනුමැතියෙන් පසු එවා ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව | 52,800 | 51,699 |
| | | (iii) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව - නිකුත් කරන ලද හිමිකම් සහතික සංඛ්‍යාව | 44,000 | 22,458 |
| | | ලියාපදිංචි කරන ලද උපලේඛන සංඛ්‍යාව | - | 46,661 |
| | | (iv) ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | | |
| | | * ඉඩම් කච්චේරි | 40 | 71 |
| | | * ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබා දුන් බලපත්‍ර | 550 | 785 |
| | | * කැඩැස්තර සිතියම් යටතේ නිකුත් කර ඇති දීමනා පත්‍ර | 300 | 538 |
| | | * ජංගම සේවා | 02 | 04 |
| | | * කොට්ඨාශ දින | 02 | 07 |
| | | * ගැටළු විසඳීම | 1,050 | 2,696 |
| 02. | තරුණ ව්‍යවසායකත්වය දිරි ගැන්වීම සඳහා රජයේ ඉඩම්වල ආයෝජන අවස්ථා ලබාදීමේ ව්‍යාපෘතිය | | රජයේ ඉඩම්- ඉඩම් කොමසාරිස් ජනරාල් මඟින් | 1,097 |
| | | | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් | සෑම දිස්ත්‍රික්කයකින්ම අක්කර 05 බැගින් ලබා දීමට කොමිෂන් අනුමැතිය ලැබීය. |
| | | | මහවැලි ඉඩම් | වාරිමාර්ග ලේකම්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් හා ඉදිරි පියවර ගැනීමට සාකච්ඡා කිරිම |
| | | | ඉඩම් කැබලි 20,000 | කළුතර - 03 |
| | | | | ගාල්ල - 04 |
| | | | | කුරුණෑගල - 28 |
| | | | | රත්නපුර - 06 |
| | | | | බදුල්ල - 06 |
| | | | | ත්‍රිකුණාමලය - 239 |
| | | | | පුත්තලම - 13 |
| | | | | අම්පාර - 33 |
| | | | | හම්බන්තොට - 299 |
| | | | | කෑගල්ල - 02 |
| | | | | මාතර - 05 |
| | | | | අනුරාධපුර - 05 |

| | | | | |
|---|---|---|---|---|
| | | | | මඩකලපුව - 418 |
| | | | | මහනුවර - 28 |
| | | | | මොණරාගල - 22 |
| | | | | **එකතුව - 1,111** |
| 03. | කාබනික නියමු පොහොර ව්‍යාපෘතිය | නිෂ්පාදන මධ්‍යස්ථාන 31 ක මෙ.ටො. 6000ක් කාබනික පොහොර නිෂ්පාදනය | | ව්‍යාපෘතිය අවසන් කිරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇත. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විමර්ශන කමිටුවක් පත්කර, විමර්ශන වාර්තාව ලැබී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. |
| 04. | Land Data Infrastructure and Land Information Service System in Sri Lanka | | | Steering Committee Appointed. |
| | | | | Sent Procurement Plan & Ethical Code of Conduct. |
| | | | | Send the comments to the ERD for the draft loan agreement with the comments of ministry of land and Survey department |
| | | | | Minister has given approval to the Agreement |
| | | | | Approved PMU |

## 2.1.5. <u>කෘෂි අංශය</u>

**2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා ප්‍රගතිය**

| වැඩසටහන | අපේක්ෂිත නිමවුමේ කාර්යයන් | 2022 ප්‍රගතිය |
|---|---|---|
| 1. දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය | • දේශීය අමුද්‍රව්‍ය ලබා ගැනීමට/වගා කිරීම සඳහා ඉඩම් ලබාදීමට අවශ්‍ය සම්බන්ධීකරණය | හඳුනාගත් අක්කර ප්‍රමාණය 176 |
| | • සමුපකාර සමිති ස්ථාපිත කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය | ශිල්ප සමිති 90 |
| | • වඩු කර්මාන්තයට අවශ්‍ය දැව ලබාගැනීමට ගස්වැවීම සඳහා ඉඩම් ලබාදීමට ක්‍රියාකාරී සැලැස්ම සැකසීම. | හඳුනාගත් අක්කර ප්‍රමාණය 370 |
| 2. කාබනික පොහොර ව්‍යාපෘතිය | • තාක්ෂණික උපදෙස් ලබාදීම. | |

## 2.2. ඉදිරි දැක්ම

### 2.2.1. ඉඩම් අත්පත් අංශය

| අනු අංකය | කාරණය | අපේක්ෂිත වන්දි සහ පොළී අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | නාගරික සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 62 |
| 2 | පහත් බිම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම | 73 |
| 3 | ගම් පුළුල් කිරීමේ කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 50 |
| 4 | ආරක්ෂක කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 53 |
| 5 | වාරිමාර්ග කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 17 |
| 6 | අධ්‍යාපන කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 28 |
| 7 | ධීවර කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 17 |
| 8 | සෞඛ්‍ය කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 16 |
| 9 | වන සම්පත්, වනජීවී කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 74 |
| 10 | පළාත් සභා හා පළාත් පාලන කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 28 |
| 11 | වෙනත් කටයුතු සඳහා ඉඩම් අත්කර ගැනීම | 72 |
| | එකතුව | 490 |

### 2.2.2. ප්‍රතිපත්ති අංශය

| අනු අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය / ක්‍රියාකාරකම | 2023 ඉලක්කය |
|---|---|---|
| i. | 1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥා පනත | • 2022 වර්ෂයේ සංශෝධනය කරන ලද, ඉඩම් සංවර්ධන ආඥා පනතේ නැවත සංශෝධිත පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශන ලබා ගැනීම.<br>• සංශෝධිත පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.<br>• සංශෝධිත පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීම.<br>• සංශෝධිත පනත් කෙටුම්පතට අදාළ ගැසට් පත්‍රය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත වීමෙන් අනතුරුව පනතක් ලෙස ගැසට් පත්‍රයෙහි පළ කිරීම. |
| ii. | 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත | • මෙම පනත සංශෝධනය කිරීමට අදාළව වැඩමුළුවක් අධිකරණ අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පැවැත්වීමට නියමිත වීම.<br>• අධිකරණ අමාත්‍යාංශය විසින් දෙනු ලබන උපදෙස් අනුව ඉදිරි ක්‍රියාමාර්ග සිදු කිරීම. |

| | | |
|---|---|---|
| iii. | 1950 අංක 09 දරණ ඉඩම් අත්පත් කිරීමේ පනත | • නීති කෙටුම්පත් සම්පාදක පනත කෙටුම්පත් කර ඉදිරිපත් කර ඇත. කෙටුම්පතෙහි ඇතුළත් කරුණු පිළිබඳව නිරීක්ෂණ නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීම හා නීතිපතිගේ නිෂ්කාශන ලබා ගැනීම.<br>• සංශෝධිත පනත් කෙටුම්පත සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.<br>• සංශෝධිත පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීම.<br>• සංශෝධිත පනත් කෙටුම්පතට අදාළ ගැසට් පත්‍රය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත වීමෙන් අනතුරුව පනතක් ලෙස ගැසට් පත්‍රයෙහි පළ කිරීම. |
| iv. | 1979 අංක 43 දරණ රාජ්‍ය ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත | • සංශෝධනය කළ යුතු වගන්ති හඳුනා ගැනීම.<br>• එම වගන්ති සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම. |
| v. | 2002 අංක 17 දරණ මැනුම් පනත | • මැනුම් පනතේ සිදු කළ යුතු සංශෝධන හඳුනාගැනීම.<br>• සංශෝධන සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.<br>• නීති කෙටුම්පත් සම්පාදක සමඟ සාකච්ඡා කොට සංශෝධිත පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීම සහ ඒ සඳහා නීතිපතිගේ නිෂ්කාශන ලබා ගැනීම. |

### 2.2.3. ව්‍යාපෘති අංශය

| අනු අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය / ක්‍රියාකාරකම | දෙපාර්තමේන්තුව | 2023 ඉලක්කය | |
|---|---|---|---|---|
| 1. | බිම්සවිය | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | මැනුම් කරනු ලබන ඉඩම් කැබලි ගණන | 70,350 |
| | | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම | 212,392 |
| | | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | නිකුත් කරනු ලබන හිමිකම් සහතික සංඛ්‍යාව | 100,000 |
| | | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | ඉඩම් කච්චේරි පැවැත්වීම | ඉඩම් කච්චේරි 10 |
| | | | නිකුත් කරනු ලබන බලපත්‍ර සංඛ්‍යාව | ඉඩම් කැබලි 1000 |
| | | | නිකුත්කරනු ලබන දීමනා පත්‍ර, බදුකර හා නිදහස් දීමනා පත්‍ර සංඛ්‍යාව | දීමනා පත්‍ර , බදුකර හා නිදහස් දීමනා පත්‍ර සංඛ්‍යාව 1500 |
| | | | පවත්වනු ලබන ජංගම සේවා සංඛ්‍යාව | ජංගම සේවා 20 |
| | | | විසඳනු ලබන ගැටළු සංඛ්‍යාව | ගැටළු 3500 |

**2.2.4.** <u>ඉඩම් අංශය</u>

| උපාය මාර්ග | ක්‍රියාකාරකම් | ඉලක්ක |
|---|---|---|
| ඉඩම්වල වටිනාකම සහ ඵලදායිතාවය ඉහළ නැංවීම. | රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික, කෘෂිකාර්මික සහ වාණිජ කටයුතු සඳහා දීර්ඝ කාලීන බදුකර හා නේවාසික කටයුතු සඳහා දීමනාපත්‍ර ලබාදීම. | බදු නිර්දේශ 6000<br>බදුකර 2500<br>දීමනාපත්‍ර 1600 |
| රජයේ ඉඩම් කළමනාකරණය කර රටේ සංවර්ධන අරමුණු සඳහා වෙන් කිරීම. | රජයේ විවිධ ආයතනවලට පළාත් පාලන ආයතන, ත්‍රිවිධ හමුදාව හා සමිති වෙත ඉඩම් බැහැර කිරීම. | ත්‍රිවිධ හමුදාව හා පළාත් පාලන ආයතන සඳහා පැවරීම් නිර්දේශ 1200 |
| | නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැනි ආයතන සඳහා සංවර්ධන කටයුතුවලට රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනාපත්‍රයන් ලබාදීම. | දීමනාපත්‍ර 100 |
| ආගමික හා සංස්කෘතික සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම. | බෞද්ධ විහාරස්ථාන සඳහා සහ අනෙකුත් ආගමික සිද්ධස්ථාන සඳහා ඉඩම් බැහැර කිරීම. | බෞද්ධ විහාරස්ථාන පූජා ඔප්පු 250<br>අනෙකුත් ආගමික සිද්ධස්ථාන බදු අනුමැති 50 |
| ආපදාවන්ට ලක් වූ පුද්ගලයින්ට පවතින භූමි සම්පතින් සහන සැලසීම. | සුනාමි ආපදාවන්ට ලක්වූ පුද්ගලයින්ට රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනාපත්‍රයන් ලබාදීම. | සුනාමි දීමනාපත්‍ර 300 |
| ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම. | ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ව්‍යවස්ථාපිත බැදීම් සඳහා ඉඩම් ලබාදීම. | ඉල්ලීම් ලැබෙන පරිදි |

.........................................
ආයතන ප්‍රධානියා

නම : ඩබ්.ඒ. චූලානන්ද පෙරේරා
තනතුර : ලේකම්
දිනය : 2023.02. 27

**ඩබ්ලිව්.ඒ. චූලානන්ද පෙරේරා**
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

# 03. පරිච්ඡේදය

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

**3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

ඒසීඒ - එෆ්

**2022.12.31 වන දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

කතය

| අයවැය 2022 | | සටහන | 2022 රු. | 2021 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 233,262,000 | 547,961,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 35,949,143 | 769,878 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 27,275,655 | 18,165,166 | ඒ.සී.ඒ -5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **296,486,798** | **566,896,044** | |
| - | **මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+ (ආ)** | | **296,486,798** | **566,896,044** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | **-** | **47,422,968** | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **296,486,798** | **519,473,076** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 467,820,000 | වැටුප්,වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 426,931,924 | 323,482,838 | |
| 172,780,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 144,615,681 | 48,022,171 | |
| 12,400,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම් | 7 | 10,190,000 | 7,552,669 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්ථන වියදම් | 9 | - | 96,928 | |
| 653,000,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **581,737,605** | **379,154,606** | |
| | **මූලධන වියදම්** | | | | |
| 10,950,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 6,928,777 | 21,551,302 | |
| 2,001,300,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 1,675,960,052 | 1,963,178,368 | |
| 69,700,000 | ප්‍රාග්ධන මාරු කිරීම් | 12 | 7,672,597 | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම | 13 | - | - | |
| 2,620,000 | හැකියා වර්ධනය | 14 | 1,352,240 | 831,650 | |
| 647,430,000 | වෙනත් මූලධන වියදම් | 15 | 299,395,189 | 302,577,032 | |
| 2,732,000,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **1,991,308,855** | **2,288,138,352** | |
| | තැන්පතු ගෙවීම් | | 7,790,086 | 750,353 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 35,144,235 | 19,624,193 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **42,934,321** | **20,374,546** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **2,615,980,781** | **2,687,667,504** | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ= (ඉ-එ)** | | **(2,319,493,983)** | **(2,168,194,428)** | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | **(2,319,493,983)** | **(2,168,194,428)** | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | **-** | | ඒසීඒ-3 |
| | | | **(2,319,493,983)** | **(2,168,194,428)** | |

*** 2022 වර්ෂයේ තොරතුරු තුළ 159 ශීර්ෂයට අදාළ තොරතුරු ද ඇතුළත්ව ඇත.**

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - පී

**2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තත්‍ය | |
|---|---|---|---|
| | | **2022** රු. | **2021** රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ - 6 | 486,406,465 | 299,243,772 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ -5 | 67,556,784 | 59,688,203 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ -3 | - | - |
| **මුළු වත්කම්** | | **553,963,249** | **358,931,975** |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 38,011,206 | 59,586,303 |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 486,406,465 | 299,243,772 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ -5 (බී) | - | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ -4 | 29,545,578 | 101,900 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ -3 | - | - |
| **මුළු වගකීම්** | | **553,963,249** | **358,931,975** |

***2022 වර්ෂයේ තොරතුරු තුළ 159 ශීර්ෂයට අදාළ තොරතුරු ද ඇතුළත්ව ඇත.**

පිටු අංක 07 සිට 37 දක්වා ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 38 සිට 50 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදු කර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන් හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

............................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
ඩබ්.ඒ. චූලානන්ද පෙරේරා
ලේකම්
දිනය : 2023.02.27

ඩබ්ලිව්.ඒ. චූලානන්ද පෙරේරා
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

............................
ගණන්දීමේ නිලධාරී
ඩබ්. ඒ. චූලානන්ද පෙරේරා
ලේකම්
දිනය : 2023.02.27

ඩබ්ලිව්.ඒ. චූලානන්ද පෙරේරා
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

............................
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ආර්.පී.ඩී.එස්.ඩී.පෙරේරා
දිනය : 2023.02.27

ආර්.පී.ඩී.එස්.ඩී. පෙරේරා
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර" - ඉඩම් මහ ලේකම් කාර්යාලය
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - සී

### 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

තතාය

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 36,413,078 | 13,292,267 |
| අග්‍රිම ලැබීම් | 233,262,000 | 547,961,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 34,360,210 | 19,001,963 |
| තැන්පතු ලැබීම් | 35,659,203 | 635,102 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **339,694,491** | **580,890,332** |
| **අඩුකළා - මුදල් වැය කිරීම්:** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 331,201,024 | 155,442,228 |
| සහනාධාර සහ මාරු කිරීම් | 8,110,899 | 5,468,785 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | (87,979,452) | 19,621,704 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | 47,422,968 |
| අත්තිකාරම් ගෙවීම් | 39,363,862 | 20,218,134 |
| තැන්පතු ගෙවීම් | 7,613,860 | 750,353 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **298,310,193** | **248,924,172** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)= (අ) - (ආ)** | **41,384,298** | **331,966,160** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අය කර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| **අඩු කළා - මුදල් වැය කිරීම් :** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදීගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 41,384,298 | 331,966,160 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | 41,384,298 | 331,966,160 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ) - (ඉ)** | (41,384,298) | (331,966,160) |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ) + (ඊ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **අඩු කළා - මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය ( එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ) - (එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

***2022 වර්ෂයේ තොරතුරු තුළ 159 ශීර්ෂයට අදාළ තොරතුරු ද ඇතුළත්ව ඇත.**

**3.4.** මූල්‍ය ප්‍රකාශ සටහන් - නොමැත

**3.5.** ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. 000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය ( රු ) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 20020299 | පොළිය (අනෙකුත්) | 1,850,000 | 1,850,000 | 2,132,972.73 | 115% |
| 20039900 | විකුණුම් හා ගාස්තු (අනෙකුත් ලැබීම්) | 400,000 | 28,000,000 | 27,608,293.33 | 98.6% |

**3.6.** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.000

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 458,110,000 | - | 430,096,643.29 | 94% |
| ප්‍රාග්ධන | 2,358,130,000 | - | 1,983,142,461.84 | 84% |

**3.7.** මු.රෙ.**208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | අභ්‍යාසලාභී උපාධිධාරී දීමනා ගෙවීම | 25,313,550 | - | 24,025,203.47 | 94.91% |

### 3.8. මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2022 දිනට මුල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම් කරණයට නියමිත | ප්‍රගතිය %ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9152 | යන්ත්‍රෝපකරණ | - | 296,743,772.38 | - | - |

### 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය කොට ඇමුණුම් 01 ලෙස පසුපිටේ අමුණා ඇත.

## 4 . පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

### 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක<br>( 2022 වර්ෂයේ වැඩ අවසන් කල ගොනු/දීමනාපත්‍ර/බදුකර සංඛ්‍යාව / 2021 වර්ෂයේ අමාත්‍යාතුමාගේ අනුමැතිය නොලැබී ඉතිරි වු ගොණු සංඛ්‍යාව + 2022 වර්ෂයේ ඉ.කො.ජ. වෙතින් ලැබුණු ගොණු සංඛ්‍යාව ) ×100 | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| 1. බදු නිර්දේශ සංඛ්‍යාව (විමසීම් 353) | | 74.68% | |
| 2. ලබා දී ඇති බදුකර හා දීමනාපත්‍ර සංඛ්‍යාව (විමසීම් 89) | | 80.66% | |
| 3. පැවරීම් සංඛ්‍යාව (විමසීම් 24) | | 84.04% | |
| 4. පූජාභූමි ඔප්පු සංඛ්‍යාව (විමසීම් 32) | | | 43.75% |
| 5. සුනාමි දීමනාපත්‍ර සංඛ්‍යාව (විමසීම් 167) | | | 66.53% |

* ඉ. කො.ජ. වෙතින් යොමු කරන ලද ගොනු / දීමනාපත්‍ර/ බදුකරවල පවතින අඩුපාඩු හේතුවෙන් නැවත ඉ.කො.ජ. වෙත යොමු කළ ගොනු/ දීමනාපත්‍ර හා බදුකර විමසීම් ලෙස වර්ග කොට ඇත.

## 05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1. හදුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්ක/අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| **1.** සියලු තැන්හී පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම. | **1.4.** විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියලු ම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරීත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන්, ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම. | භෞතික ඉලක්ක සපුරා ගැනීම ප්‍රතිශතයක් ලෙස | පුජා ඔප්පු 43.75% | සුනාමි දීමනාපත්‍ර 66.53% | බදු නිර්දේශ 74.68%<br>බදුකර හා දීමනාපත්‍ර 80.66%<br>පැවරීම් 84.04% |
| **2.** සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර | **2.3.** 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේ, ගොවි පවුල් සහ ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායීතාවය සහ ආදායම, ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන | එම | පුජා ඔප්පු 43.75% | සුනාමි දීමනාපත්‍ර 66.53% | බදු නිර්දේශ 74.68%<br>බදුකර හා දීමනාපත්‍ර 80.66%<br>පැවරීම් 84.04% |

| | | | | | |
|---|---|---|---|---|---|
| කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම. | සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපොළ සහ වටිනාකම එකතු කිරීම් හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබා දීම මගින් දෙගුණ කිරීම. | | | | |
| | **2.4.** 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවැතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවැතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ, කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාලගුණ තත්ත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම. | එම | පූජා ඔප්පු 43.75% | සුනාමි දීමනාපත්‍ර 66.53% | බදු නිර්දේශ 74.68% බදුකර හා දීමනාපත්‍ර 80.66% පැවරීම් 84.04% |
| **3.** නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම. | **3.9.** 2030 වන විට රසායනික, වාතය, ජලය සහ දූෂණය වීමත්, අපිරිසිදු වීමත් නිසා ඇති වන මරණ සහ රෝගී තත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම. | එම | පූජා ඔප්පු 43.75% | සුනාමි දීමනාපත්‍ර 66.53% | බදු නිර්දේශ 74.68% බදුකර හා දීමනාපත්‍ර 80.66% පැවරීම් 84.04% |
| **5.** ස්ත්‍රී, පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම. | **5.1.** කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හී සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම. | එම | පූජා ඔප්පු 43.75% | සුනාමි දීමනාපත්‍ර 66.53% | බදු නිර්දේශ 74.68% බදුකර හා දීමනාපත්‍ර 80.66% පැවරීම් 84.04% |
| | **5.අ.** කාන්තාවන්ට ආර්ථික අයිතිවාසිකම් ලබා දීම සඳහා වූ සංශෝධන සිදු කිරීමට කටයුතු කිරීම සහ දේශීය නීතිවලට අනුව ඉඩම් සහ වෙනත් ආකාරවල දේපල මූල්‍ය සේවාවන්, උරුමයන් සහ ස්වභාවික සම්පත්වල හිමිකාරීත්වය ලබා ගැනීම සහ පාලනය සිදුකිරීම සඳහා අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම. | එම | පූජා ඔප්පු 43.75% | සුනාමි දීමනාපත්‍ර 66.53% | බදු නිර්දේශ 74.68% බදුකර හා දීමනාපත්‍ර 80.66% පැවරීම් 84.04% |
| **6.** සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම. | **6.6.** 2020 වන විට කඳු, වන ගහන, තෙත්බිම්, ගංගාවන්, භූ ගත ජලය සහ විල් ඇතුළුව ජලය සම්බන්ධ ජීව පද්ධති ආරක්ෂා කිරීම සහ නැවත ස්ථාපිත කිරීම. | එම | පූජා ඔප්පු 43.75% | සුනාමි දීමනාපත්‍ර 66.53% | බදු නිර්දේශ 74.68% බදුකර හා දීමනාපත්‍ර 80.66% පැවරීම් 84.04% |
| **7.** සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම. | **7.ආ.** 2030 වන විට විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල, කුඩා දිවයින් රාජ්‍යයන්හී සහ අනෙකුත් රටවල දේශ සීමාවන්ගෙන් ආවරණය වූ සංවර්ධනය වෙමින් පවත්නා රටවල්ද ඇතුළත්ව සියලුම සංවර්ධනය වන රටවලට ඔවුනගේ වැඩසටහන් සැලසුම්වලට අනුකූලව නවීන සහ තිරසර බලශක්ති සේවා සැපයීම සඳහා යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම සහ තාක්ෂණය වැඩිදියුණු කිරීම. | එම | පූජා ඔප්පු 43.75% | සුනාමි දීමනාපත්‍ර 66.53% | බදු නිර්දේශ 74.68% බදුකර හා දීමනාපත්‍ර 80.66% පැවරීම් 84.04% |
| **8.** සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා | **8.4.** 2030 දී, තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ දස අවුරුදු වැඩ සැලැස්මට අනුකූලව, ලෝක නිෂ්පාදනයේ සහ පරිභෝජනයේදී සම්පත් උපයෝජනය කාර්යක්ෂමව කිරීම සහ ආර්ථික සංවර්ධනයේදී පරිසරයට හානි සිදුවීම නැවැත්වීමට ක්‍රියාමාර්ග ගැනීම ප්‍රගතිශීලී | එම | පූජා ඔප්පු 43.75% | සුනාමි දීමනාපත්‍ර 66.53% | බදු නිර්දේශ 74.68% බදුකර හා දීමනාපත්‍ර 80.66% පැවරීම් 84.04% |

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රවර්ධනය කිරීම. | ආකාරයට වර්ධනය කිරීම. මෙහිදී සංවර්ධනය වූ රටවල් විසින් කිරීම පෙරමුණ ගනු ලැබේ. | | | | |
| **15.** භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණය ට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම. | **15.1.** 2020 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන්, විශේෂ වනාන්තර, කඳු සහ වියළි බිම් අන්තර් ජාතික ගිවිසුම්වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගාසිටුවීම සහ තිරසර අන්දමින් භාවිත කිරීම තහවුරු කිරීම. | එම | පූජා ඔප්පු 43.75% | සුනාමි දීමනාපත්‍ර 66.53% | බදු නිර්දේශ 74.68% බදුකර හා දීමනාපත්‍ර 80.66% පැවරීම් 84.04% |
| | **15.3.** 2030 වන විට කාන්තාරකරණය තුරන් කිරීම, කාන්තාරකරණය, නියඟය සහ ගංවතුර නිසා බලපෑමට ලක් වූ ඉඩම් ද ඇතුළු ව විනාශයට පත් වූ ඉඩම් සහ පස නැවත යථා තත්ත්වයට පත්කිරීම සහ ඉඩම් විනාශයට පත්නොවන ලෝකයක් ඇති කරගැනීම. | එම | පූජා ඔප්පු 43.75% | සුනාමි දීමනාපත්‍ර 66.53% | බදු නිර්දේශ 74.68% බදුකර හා දීමනාපත්‍ර 80.66% පැවරීම් 84.04% |
| | **15.4.** 2030 වන විට තිරසර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය ප්‍රතිලාභ ගෙන දීමට ඒවායේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා ජෛව විවිධත්වය ද සමඟින් කඳුකර පරිසර පද්ධති සංරක්ෂණය කිරීම තහවුරු කිරීම. | එම | පූජා ඔප්පු 43.75% | සුනාමි දීමනාපත්‍ර 66.53% | බදු නිර්දේශ 74.68% බදුකර හා දීමනාපත්‍ර 80.66% පැවරීම් 84.04% |

### 5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම උදෙසා පවතින පනත් සමාලෝචනය සහ සංශෝධනයට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, මේවා ක්‍රියාත්මක තත්ත්වයට පත් කර ගැනීම සඳහා දිගු කාලයක් ගත වීම පවත්නා අභියෝගයකි.

## 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක සංඛ්‍යා කළමණාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 35 | 26 | ඇබෑර්තු 09 |
| තෘතියික | 05 | 03 | ඇබෑර්තු 02 |
| ද්විතියික | 546 | 530 | ඇබෑර්තු 16 |
| ප්‍රාථමික | 51 | 28 | ඇබෑර්තු 23 |
| වෙනත් | 03 | 01 | ඇබෑර්තු 02 |

**2023.01.31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය මත පදනම්ව ඉහත වගුව සකස් කර ඇත.**

## 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ආයතනයේ මානව සම්පත් හිඟයක් පවතී. ඒ හේතුවෙන් එක් නිලධාරියෙකු හට ප්‍රමාණවත් පමණට වඩා වැඩි රාජකාරී ප්‍රමාණයක් පැවරීමට සිදුව ඇති අතර, එමගින් යම් රාජකාරි කටයුත්තක් ඉටු කිරීමේ දී අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගත වේ.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම්/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| EXPENDTURE AND PAYMENT PROCEDURE | 02 | දින 01 | රු18000/- | - | දේශීය | වියදම් සහ ගෙවීම් අඩු කිරීම සම්බන්ධ දැනුම |
| ROLL & RESPONCIBILITIES OF LEAVE CLERK | 01 | දින 02 | රු. 8500/- | - | දේශීය | නිවාඩු ලිපිකරුගේ වගකීම් පිළිබඳ දැනුම |
| ANNUAL STOCK VERIFICATION AND DISPOSAL,PROCEDURES | 04 | දින 02 | රු. 34000 /- | - | දේශීය | භාණ්ඩ සමීක්ෂණය හා අපහරණය පිළිබඳ දැනුම |
| MICROSOFT EXCEL TRAINING | 04 | දින 02 | රු. 48000/- | - | දේශීය | MS Excel භාවිතය පිළිබඳ දැනුම |
| Advance Certificate course in public Procurement Asset Management | 01 | දින 01 | රු. 30000/- | - | දේශීය | ප්‍රසම්පාදන හා වත්කම් කළමණාකරණය පිළිබඳ දැනුම |
| Losses loss recoveries & Write off | 02 | දින 02 | රු. 17000/- | - | දේශීය | පාඩු හා හානි පූර්ණය පිළිබඳ දැනුම |
| Maintain of Personal File | 02 | දින 02 | රු. 17000/- | - | දේශීය | ලිපිගොනු කළමණාකරණය පිළිබඳ දැනුම |
| ලිපිගොණු කළමණාකරණය හා කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන | අමාත්‍යාංශයේ සියලුම සං.නි. සහ ක.සේ.නි. | දින 02 | රු. 16890/- | - | දේශීය | ලිපිගොනු කළමණාකරණය හා කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහ නේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.000) | | වැඩසටහ නේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Telephone Skills and Etiquette Training for Secretaries and front Office Staff | සියලුම කාර්යාල සේවක සේවයේ නිලධාරීන් | දින 02 | රු. 7000/- | - | දේශීය | පිළිගැනීමේ නිලධාරිවරයෙකු සතු ආකල්පමය දැනුම |
| පැය 150 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | අමාත්‍යාංශයේ සියලුම සං.නි. සහ ක.සේ.නි | දින 27 | රු.112500/- | - | දේශීය | දෙමළ භාෂාව පිළිබඳ දැනුම |
| Computer Hardware with Network | 02 | මාස 06 | රු. 70700/- | - | දේශීය | මාර්ග නීතිරීති පිළිබඳ දැනුම හා මොටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම |
| Network Administration with Security Course | 01 | මාස 06 | රු. 37500/- | - | දේශීය | ජාලගතකරණය සම්බන්ධ ආරක්ෂක මුරපද භාවිතය පිළිබඳ දැනුම |
| Computer Hardware with Network | 01 | මාස 06 | රු. 35350/- | - | දේශීය | පරිගණක දෘඩාංග පිළිබඳව දැනුම |
| Computer Hardware with Network | 01 | මාස 06 | රු. 35350/- | - | දේශීය | පරිගණක දෘඩාංග පිළිබඳව දැනුම |
| ප්‍රවාහන කළමනාකරණය | 01 | දින 01 | රු. 4000/- | - | දේශීය | ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ දැනුම |
| පෞද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම | 03 | දින 02 | රු. 22500/- | - | දේශීය | පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම පිළිබඳ දැනුම |
| ගිණුම් පොත්පත් ක්‍රමානුකූලව නඩත්තු කිරීම | 07 | දින 02 | රු.52500/- | - | දේශීය | ගිණුම් පොත්පත් ක්‍රමානුකූලව නඩත්තු කිරීම පිළිබඳ දැනුම |
| Event Management | 01 | දින 02 | රු.7500/- | - | දේශීය | සිද්ධි කළමණාකරණය පිළිබඳ දැනුම |
| Government Payroll system | 02 | දින 03 | රු.36000/- | - | දේශීය | රජයේ වැටුප් සැකසීම පිළිබඳ දැනුම |
| ලේකම්තුමාගේ මූලිකත්වයෙන් පැවැති දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | අමාත්‍යාංශයේ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන් තුවේ හා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන් තුවේ සියලුම නිලධාරීන් | දින 01 | රු.83990/- | - | දේශීය | දැනුම හා ආකල්ප වැඩි දියුණු කිරීම පිළිබඳව දැනුම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහ නේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.000) | | වැඩසටහ නේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| MPAM පශ්චාත් උපාධි පාඨමාලාවට අදාළ ගාස්තු ප්‍රතිපූර්ණය | | | රු.150000/- | - | දේශීය | |
| කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 04 | දින 02 | රු.40000/- | - | දේශීය | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම |
| රජයේ වාහන නඩත්තුව | 01 | දින 01 | රු.5000/- | - | දේශීය | රජයේ වාහන නඩත්තුව පිළිබඳ දැනුම |
| කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 03 | දින 02 | රු.40000/- | - | දේශීය | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම |
| ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම | 04 | දින 02 | රු.15000/- | - | දේශීය | ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම පිළිබඳ දැනුම |
| විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | 01 | දින 02 | රු.10000/- | - | දේශීය | විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට අදාළ දැනුම |
| රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | 01 | දින 01 | රු.5000/- | - | දේශීය | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ දැනුම |

***ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් සියළුම නිලධාරීන් සෑම රාජකාරී කටයුත්තක් කෙරෙහි ම යම් මට්ටමක අවබෝධයක් ලැබීම හා ඒ තුළින් පැවරෙන ඕනෑම රාජකාරී කටයුත්තක් වඩාත් කාර්යක්ෂම හා ඵලදායීව ඉටු කිරීමේ හැකියාව ලැබේ.

## 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්<br>(වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය ( GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. | - | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ. | ඇතැම් විට මාසය ඉක්මවා ද පිළිතුරු ලැබේ. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී සාකච්ඡා කිරීම. |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම | අනුකූල වේ. | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ. | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කිරීම. | අනුකූල වේ. | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ. | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල වේ. | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය<br><br>(අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල නොවේ. | 2022.01.31 දිනට වාහන 02ක පමණක් ඉන්ධන පරීක්ෂාව කර ඇත. ඉන්ධන මිල ඉහළ යාමත්,ඉන්ධන අර්බුදයත්, හේතුවෙන් අමාත්‍යාංශයේ වාහන භාවිතය අත්‍යාවශ්‍ය රාජකාරී සඳහා පමණක් යොදා ගනිමින් වාහන භාවිතය අවම කරමින් රාජ්‍ය වියදම් කළමනාකරණය කර ඇත.මේ වන විට ජාතික ඉන්ධන බලපත්‍රය මත සතියකට නියමිත කෝටාවකින් පමණක් නිකුත් කරන බැවින් හා ටැංකියේ උපරිම ධාරිතාවයට ඉන්ධන ලබා නොදීම හේතුවෙන් ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට ප්‍රායෝගිකව හා ඵලදායිතාවයේ ගැටළු ඇතිවේ. | පවතින ප්‍රතිපාදන සීමාවන් සැලකිල්ලට ගනිමින් 2023 වසර තුළ හැකි උපරිම ආකාරයෙන් ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු සකස් කරනු ලැබේ. |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ. | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය<br><br>(අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයෙන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ. | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම.** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම.** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පත් සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ. | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | - | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ. | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | - | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම. | අනුකූල නොවේ. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පවතී. | රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමා - ත්‍යාංශය වෙත පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස ඉල්ලීම් සිදු කර ඇත. |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය<br><br>(අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියල්ම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ. | නව පුරවැසි / සේවාලාභි ප්‍රඥාප්තිය සකස් කර අවසන් කර ඇති අතර එය අමාත්‍යාශ වෙබ් අඩවියේ පළ කර ඇත. | |
| 18.2 | එම චක්‍රලේඛ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ. | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ. | | |